# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 80 දරන නිවාස දේපළ උපරිමය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

**1988 අංක 80 දරන නිවාස දේපළ උපරිමය (සංශෝධිත) පනත**

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 20 වන දින]

එල්. ඩී.—ඔ. 35/86

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 80 දරන නිවාස දේපළ උපරිමය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 34 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ, 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ පනතේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— **ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 1 දරන පනතේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) "ඒ නිවාසය විකිණිය හැකි ය." යන වචන වෙනුවට, "විකිණීමෙන්, තෑගි දීමෙන් හෝ අන්‍යාකාරයකින් ඒ නිවාසය බැහැර කරනු ලැබිය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "විකිණිය හැකි බව" යන වචන වෙනුවට "බැහැර කළ හැකි බව" යන වචන ආදේශ කිරීමෙන්.

3. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 34 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ "විකුණනු නොලැබූ" යන වචන වෙනුවට "විකිණීම, තෑගිදීම, හෝ අන්‍යාකාරයක් මගින්, බැහැර කරනු නොලැබූ" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. **ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**4.** මේ පනතේ 2 වන වගන්තිය සහ 3 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන, 1973 ජනවාරි මස 13 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, අවසර ලත් නිවාස සංඛ්‍යාවට වැඩියෙන් යම් තැනැත්තකුට අයිතිව තිබුණා වූ ද, ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය හෝ 12අ වගන්තිය හෝ යටතේ තදනන්තරව වෙනත් යම් තැනැත්තකු වෙත පවරන ලද නිවසක් නැතහොත් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය යටතේ විකිණීම සඳහා ගිවිසුමකට ඇතුළත්ව ඇත්තේ යම් නිවසක් සම්බන්ධයෙන් ද එවැනි නිවසක් නොවන, ඒ තැනැත්තා විසින්— **සංශෝධනය අතීතයට බලපෑම.**

(අ) තෑගි කිරීමෙන් ; සහ

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව, එම නිවාසය එම තැනැත්තා විසින් බැහැර කරනු ලැබිය හැකි කාලසීමාව ඇතුළත,

බැහැර කරනු ලැබුවා වූ ද නිවසක්, ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය අදාළ කිරීමේ කාර්ය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව බැහැර කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම **දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.**